# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)- 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: SA/MA/DO/Circular-2013
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2013.11. 29

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක: 230/2013

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

මහත්මයාණෙනි / මහත්මියනි,

<u>ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම</u>

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2013.10.02 දිනැති චක්‍රලේඛ අංක 03/2013 මගින් හඳුන්වා දී ඇති ගිණුම්කරණ ප්‍රමිත අංක 4 ට අනුව 2013 වර්ෂයේ සිට මෙම චක්‍රලේඛයේ 1 වන ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන වත්කම් අත්පත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා ලබා ගන්නා දේශීය සහ විදේශීය ණයවල ඇතුලත් ප්‍රාග්ධනිත කළ හැකි ණය ගැනුම් පිරිවැය පහත උපදෙස් වලට අනුකූලව ගිණුම්ගත කළ යුතුය.

1. සුදුසුකම් ලබන වත්කම්

   සුදුසුකම් ලබන වත්කම් ලෙස කාර්යාලයීය ගොඩනැගිලි , රෝහල්, මහාමාර්ග, පාලම් සහ විදුලි උත්පාදන මධ්‍යස්ථාන වැනි යටිතල පහසුකම් මෙන්ම විකිණීම හෝ එහි අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා සැලකිය යුතු කාල පරිච්ඡේදයක් ගතවන වත්කම් වේ.

2. ප්‍රාග්ධනිත කළ හැකි ණය ගැනුම් පිරිවැය වර්ග

   i. බැංකු අයිරා හෝ කෙටිකාලීන හා දිගු කාලීන ණය මත පොලී

   ii. ණය ගැනුම් සම්බන්ධයෙන් වූ අධිමිල හෝ අවමිල ක්‍රමක්ෂය කිරීම

   iii. ණය ගැනුම් පිළියෙල කිරීම හා සම්බන්ධ අදාළ පිරිවැය ක්‍රමක්ෂය කිරීම.

   iv. මූල්‍ය කල්බදු සම්බන්ධයෙන් වූ මූල්‍ය ගාස්තු

   v. පොලී පිරිවැයට ගැලපුමක් ලෙස සලකනු ලබන ප්‍රමාණයට වූ, විදේශීය මුදලින් කරනු ලබන ණය ගැනුම් වලින් පැන නගින විනිමය වෙනස්කම්

3. සුදුසුකම් ලබන වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස, ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කළ යුත්තේ පහත අවස්ථා සම්පූර්ණ වී ඇත්නම් පමණි.

   i. වත්කම සඳහා වියදම් දැරීම,

   ii. ණය ගැනුම් පිරිවැය දැරීම , සහ

   iii. වත්කම එහි අපේක්ෂිත පරිහරණය හෝ විකිණීම සඳහා පිළියෙල කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම

4. ඒ අනුව ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සුදුසුකම් ලබන වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස පොලී සහ විනිමය වෙනස්කම් යන ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම පහත සඳහන් ආකාරයට සිදු කළ යුතුය.

   i. සුදුසුකම් ලබන වත්කම් වෙනුවෙන් ලබා ගන්නා ලද දේශීය හා විදේශීය ණය සඳහා වර්ෂය තුලදී ගෙවනු ලැබූ පොලී සහ විනිමය වෙනස්කම්වලට අදාළ ගැලපීම් වර්ෂය අවසානයේදී අදාල පුනරාවර්තන වැය විෂයන්ට අධිභාර කර අදාල ව්‍යාපෘති ගිණුම්වලට ප්‍රාග්ධනිත කිරීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. එබැවින් එවැනි සුදුසුකම් ලබන වත්කම් අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම සිදුකරනු ලබන අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු ඉහත සඳහන් ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන අදාල වැය විෂයන් යටතේ සලසා ගත යුතු ය.

   ii. ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම, අදාල සුදුසුකම් ලබන වත්කම හෝ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදය තුල පමණක් සිදු කළ යුතු අතර අදාල කාර්යය ක්‍රියාත්මක නොවන කාල පරිච්ඡේදයේදී හෝ ව්‍යාපෘතිය / වත්කම නිමවීමෙන් හෝ මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන කිසිදු ණය ගැනුම් පිරිවැයක් සුදුසුකම් ලබන වත්කමේ පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනිත නොකළ යුතුය.

5. ඉහත උපෙදස් වලට අනුව ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම සම්බන්ධයෙන් වන සියලු කරුණු වලදී **"ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 4"** හි විධිවිධාන පිළිපැදිය යුතු වන අතර මෙම චක්‍රලේඛයේ ඇතුලත් කරුණු පිළිබඳ තවදුරටත් අවශ්‍ය පැහැදිලි කර ගැනීම් සඳහා, දුරකථන අංක 011-2484753 මගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සාර්ව හා උපචිත ගිණුම්) ඇමතිමෙන් ලබා ගත යුතුය.

මෙයට-විශ්වාසී,

පී.බී.ජයසුන්දර

ලේකම්

පිටපත්:

1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව